# සංක්ෂේපයෙන්

වර්තමාන ශ්‍රී ලංකාවේ තරුණ පරපුර අතර රැකියා වියුක්තිය උග්‍ර සමාජයීය ගැටළුවක් බවට පත්වී ඇත. ඇතැම්විට පොදු සමාජයේදී, සේවා ආයතන වලද වෘත්තීන්හි නිරත අය තුළ ද ගැටළු පැන නඟී. මෙයට හේතුව ලංකාවේ විධිමත්ව හැඩ ගැසුණු වෘත්තීය සංවර්ධන වැඩ පිළිවෙලක් නොමැතිවීමය.

පාසල් අධ්‍යාපනය ලැබූවත් අතරින් ද්විතීයික අධ්‍යාපනය අවසන් කළ, අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ සහතික දරන්නන් අතර රැකියා විරහිත භාවය වැඩි වශයෙන් දෘශ්‍යමාන වේ. වර්තමාන සමාජය දැනුම පදනම් කරගත් සමාජයක් බවට පරිවර්තනය වෙමින් පවතී. අනාගතය හැඩ ගස්වා ලීමෙහි ලා ප්‍රධාන බලවේගය බවට, විද්‍යාව සහ තාක්ෂණය පත්ව ඇත. රට සාපේක්ෂව වර්තමාන වෘත්තීය ලෝකය තුළ විවිධාකාර වූ වෘත්තීය ක්ෂේත්‍ර පැන නැගී ඇත. වෘත්තීය ලෝකයේ වෘත්තීය අවශ්‍යතා විවිධවේ. මේ නිසා එලදායී සංවර්ධනයක් ලැබීමට එම වෘත්තීය ක්ෂේත්‍රවලට අවබෝධයෙන් ප්‍රවිෂ්ට විය යුතුව ඇත.

විධිමත් අධ්‍යාපනය සහ සේවා නියුක්තිය අතර නොගැලපීමක් දක්නට ඇත. පාසලෙන් ඉවත්වන තරුණ තරුණියන් වැඩි පිරිසක් කායශ්‍රමයීය රැකියා අපේක්ෂා කරන නිසා වෘත්තීය ලෝකයේ පවත්නා වෘත්තීය මාර්ගයන් රැසක් ඔවුනට වැසී යයි. මේ නිසා රටේ, ආර්ථිකයේ රැකියා අවස්ථාවන් බහුලව පවතින අංශවලට යොමුකරන විෂයමාලා විධිමත් පාසල් තුළ ක්‍රියාත්මක කිරීම අවශ්‍යවේ. මෙවැනි තත්ත්වයක් මත ශ්‍රී ලංකාවේ රැකියා විරහිත භාවයෙන් පෙළෙන බහුතරයක් වන අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ සහතිකය ලබා ගැනීමට බලාපොරොත්තුවන සිසුන්ගේ වෘත්තීය අපේක්ෂණ විමර්ශනය කිරීම කාලීන අවශ්‍යතාවයක් වේ.

අධ්‍යයනය සඳහා දීප ව්‍යාප්තව පැතුරුණු නියැදියක් තෝරාගැනීම අපහසු වූ අතර කාලය සීමිතව යොදා ගැනීමටද සිදුවන ලදී. මේ නිසා අධ්‍යයනය සඳහා ගිරිඋල්ල අධ්‍යාපන කලාපයේ පන්නල අධ්‍යාපන කොට්ඨාශයේ නගරබද (1AB) සහ ගම්බද (1C) යන පාසල් දෙක තෝරාගෙන ඒ ඇසුරෙන් ශ්‍රී ලංකාවේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙ) සිසුන්ගේ වෘත්තීය අපේක්ෂණ අධ්‍යයනය කිරීමට අපේක්ෂා කෙරේ. නගරබද (1AB) පාසලක් ලෙස ගිරිඋල්ල වික්‍රමශිලා මධ්‍ය මහා විද්‍යාලයත්, ගම්බද (1C) පාසලක් ලෙස බෝපිටිය මහා විද්‍යාලයත් තෝරාගෙන ඇත. නගරබද (1AB) පාසලෙන් සිසුන්

සැටක් ද, ගම්බද (1C) පාසලෙන් සිසුන් හතළිහක් ද වශයෙන් අහඹු ලෙස සිසුන් සියයක නියැදියක් අධ්‍යයනය සඳහා සම්බන්ධ කර ගැණින. නියැදිය ඇසුරෙන් ලබාගත් ප්‍රමාණාත්මක සහ ගුණාත්මක දත්ත වඩාත් අර්ථවත් කරගැනීම සඳහා විගුහ කර විශ්ලේෂණය කරන ලදී.

දත්ත විශ්ලේෂණය කර ලබාගත් තොරතුරුවලට අනුව සිසුන්ගේ වෘත්තීය අපේක්ෂණයේ, රැකියා තේරීම් අනුපිළිවෙල, සම්ප්‍රදායික රටාවට වඩා විශාල වෙනසක් නොදක්වයි. තම රැකියා අපේක්ෂණයේ අඩු නැඹුරුතාවයක් විද්‍යමාන විය. ගම්බද සහ නගරබද පරිසරයන්හි වෘත්තීය අපේක්ෂණයේ වෙනසක් දක්නට ලැබුණු අතර ස්ත්‍රී, පුරුෂ භාවය අනුවද වෘත්තීය අපේක්ෂණයේ වෙනස්කම් හඳුනාගත හැකි විය. එමෙන්ම ශිෂ්‍ය අභිරුචීන්, උසස් අධ්‍යාපන අවශ්‍යතා යන පුද්ගල බද්ධ සාධක ද, පවුලේ ආර්ථික තත්ත්වය, අධ්‍යාපන මට්ටම යන සාධක ද සිසුන්ගේ වෘත්තීය අපේක්ෂා කෙරෙහි බලපා ඇති බව අනාවරණය විය. වැඩි වශයෙන් කැපී පෙනුන සිසුන්ගේ වෘත්තීය අපේක්ෂණවල අසමතුලිතතාවය අවම කිරීම සඳහා පාසල් විෂය මාලාවට අදට වඩා වෘත්තීය විෂයයන් ඇතුළත් කළ යුතුවේ. ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටක් නිසා උසස් මට්ටමට වෘත්තීය අධ්‍යාපනයක් ලබා දීම අපහසු කාර්යයකි. එසේ වුවද සිසුනට ප්‍රායෝගික විෂයයන් හඳුන්වා දෙමින් සම්බර පෞරුෂයක් ගොඩ නගාගත හැකි අන්දමේ උපදේශන හා වෘත්තීය මාර්ගෝපදේශ සේවාවක් පාසල තුළ ස්ථාපිත කිරීම යෝග්‍ය වේ. පුද්ගල සංවර්ධනය මෙන්ම වෘත්තීය සංවර්ධනය පෝෂණය කිරීම් ශක්තිමත් වැඩ පිළිවෙලවල් විධිමත් පාසලට අවශ්‍යවේ.